# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 2009 අංක 72 දරන සෑම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත

**[සහතිකය සටහන් කළේ 2009 දෙසැම්බර් මස 23 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

2009 දෙසැම්බර් මස 24 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 5.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2009 අංක 72 දරන සෑම් භාරය
## (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 දෙසැම්බර් මස 23 වන දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී.) 31/2007.

### සෑම් භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"සෑම් භාරය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන භාරයක් එකී භාරය සම්බන්ධයෙන් සියලු කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කොළඹ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී භාරය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී භාරය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ ඒ භාරය සංස්ථාගත කරන ලෙස ඉල්ලුම් කර ඇති හෙයින් සහ එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත සඳහා වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2009 අංක 72 දරන සෑම් භාරය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) සෑම් භාරයෙහි භාරකාර මණ්ඩලයේ සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවෙහි සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරනු ලබන තැනැත්තන් ද (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "සෑම් භාරය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් වන්නේ ය. තව ද, එකී සංස්ථා නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය. සෑම් භාරය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒවා පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) මුස්ලිම් ජාතිකයන්ගේ අධ්‍යාපන ප්‍රගතිය හා දැනුම නංවාලීම, අගහිඟකම්වලින් පෙළෙන මුස්ලිම් සිසුන්හට ශිෂ්‍යත්ව හා වෙනත් යම් මූල්‍යාධාර සැපයීම ;

(ආ) දිළිඳු මුස්ලිම් ජනතාව සඳහා නිවාස, අධ්‍යාපන ආයතන, මුස්ලිම් දේවස්ථාන, ආරෝග්‍යශාලා සහ වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථාන පිහිටුවීම, ඉදි කිරීම සහ නඩත්තු කිරීම හෝ ඒවා පිහිටුවීම ;

(ඇ) මුස්ලිම් ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනය සඳහා සහ වෙනත් ක්‍රියාකාරකම් සඳහා උපකාර කිරීම ;

(ඈ) මුස්ලිම්වරුන්ට වන ව්‍යසන හා ස්වාභාවික විපත් හේතුවෙන් සිදුවන දරිද්‍රතාවයට සහ ආපදාවට සහන සැලසීම සඳහා වන කටයුතු නංවාලීම, දිරිගැන්වීම සහ එම කටයුතුවලට සහාය වීම සහ භාරගෙන ඉටු කිරීම ;

(ඉ) දිළිඳු මුස්ලිම් අයට ජලය හා විදුලිය වැනි මූලික අවශ්‍යතාවන් සැපයීම ;

(ඊ) මුස්ලිම් ජනතාව අතර ඉස්ලාමීය, අධ්‍යාපනයට අදාළ පොත්පත්, වාරප්‍රකාශ හා සඟරා රැස් කිරීම, වර්ග කිරීම, පරිවර්තනය කිරීම, මුද්‍රණය කිරීම, පළ කිරීම සහ බෙදා හැරීම ; සහ

(උ) මුස්ලිම් ජනතාව අතර වාර්ගික, ජාතික සහ අන්තර් ජාතික අවබෝධය, ආගමික සමගිය, හොඳ හිත හා සාමය වර්ධනය කිරීම සඳහා වන ක්‍රියාකාරකම් නංවාලීම, දිරිගැන්වීම, එම කටයුතුවල දී සහාය වීම සහ ඒවා පෝෂණය කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, සංස්ථාවේ මුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ

නියුක්ත කර ගැනීමේ, සේවයේ යෙදවීම සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වූ හෝ සියලු ක්‍රියා, කරුණු හෝ දේ කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ භාරකාර මණ්ඩලය.

**5.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව වූ දිනයේ දී ධුර දරන භාරයේ භාරකාර මණ්ඩලයේ භාරකරුවන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට සංස්ථාවේ භාරකාර මණ්ඩලයේ භාරකරුවන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**6.** (1) 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු සභාපති, ගරු ලේකම්, ගරු භාණ්ඩාගාරික සහ භාරකාර මණ්ඩලය විසින් පත් කරනු ලැබූ පස් දෙනකුට නොඅඩු කමිටු සාමාජිකයන්ගෙන් සැදුම්ලත් (මින්මතු “කමිටුව” යනුවෙන් හඳුන්වනු ලබන) කළමනාකරණ කමිටුව විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී නිලය දරන්නා වූ භාරයෙහි කමිටුවේ සාමාජිකයන්, ප්‍රථම කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් විය යුතු ය.

සංස්ථාවේ රීති.

**7.** (1) සාමාජිකයන් බඳවා ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද නිලධරයන් සහ සංස්ථාවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සඳහා ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සම්බන්ධයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් සංස්ථාව විසින් සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) සංස්ථාව විසින් සාදනු ලබන යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයට ම එවැනි රැස්වීමක දී වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

8. (1) සංස්ථාවේ අරමුදල, පහත දැක්වෙන මුදල්වලින් සංයුක්ත විය යුතු ය :—

(අ) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ ඒ දිනයේ දී භාරයේ බැරට තිබෙන සියලු මුදල් එදින සිට සංස්ථාවට පැවරෙන්නේ ය ;

(ආ) මේ පනත ආරම්භ වීමේ දිනයට පසු සංස්ථාවට උපචිත වන සියලු මුදල් ; සහ

(ඇ) සංස්ථාවට දෙනු ලැබූ යම් පරිත්‍යාගයන් හෝ තෑගි.

(2) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීමේ දී සහ එහි පරමාර්ථ ඉටු කර ගැනීමේ දී දරනු ලැබූ වියදම් ගෙවීම සඳහා භාරයේ අරමුදලේ බැරට ඇති සියලු මුදල් නොඅඩුව ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

9. (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනවලින් යම් ආයතනයක සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

*භාරය විසින් ගෙවිය යුතු සහ භාරයට ලැබිය යුතු ණය.*

**10.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති භාරයේ සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කරනු ලැබිය යුතු ය. එදිනට භාරයට අයවිය යුතුව තිබූ සියලු ණය, ගෙවිය යුතු දායක මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාව වෙත ගෙවිය යුතු ය.

*සංස්ථාවේ මුද්‍රාව.*

**11.** සංස්ථාවේ මුද්‍රාව ලේකම්වරයා භාරයේ තිබිය යුතු අතර, කමිටුව විසින් නිශ්චය කරනු ලබන ආකාරයට එය වෙනස් කරනු ලැබිය හැකි ය. කමිටුවේ අනුමතිය ඇතිව සහ කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම යම් තැනැත්තකු විසින් සාක්ෂිකරුවකු ලෙස කර ඇති අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

*විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.*

**12.** සංස්ථාව විසුරුවා හැරීමේ දී එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

*ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.*

**13.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.*

**14.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.